සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

# විද්‍යාරත්න විද්‍යායතන පිරිවෙන - හොරණ

## පළමු වාර පරීක්ෂණය - 2022

## 1st Term Test 2022 - August

| 8 ශ්‍රේණිය | නර්තනය | කාලය පැ. 2 යි. |
|---|---|---|

### I කොටස

■ වරහන තුළින් ගැළපෙන පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

(මැණ්ඩිය, සිරසපාද, සරල බව, කස්තිරම, සමබරතාව, පා සරඹ, සුළු මහ, ප්‍රත්‍යංග, ගොඩ සරඹ, ගායනය, අවකාශය, සුළු මැදුම්)

01. නර්තනය සඳහා අවශ්‍ය ශාරීරික ...................................... හා නිවැරදි හැඩතල සකස් කර ගැනීම සඳහා නම්‍යතා අභ්‍යාස කිරීම ඉතා වැදගත් වේ.
02. ...................................... ගැමි නැටුම්වල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයකි.
03. මාත්‍රා 23 එකතු වීමෙන් ...................................... දෙතිත තාල රූපය නිර්මාණය වේ.
04. නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු මූලික අංගහාරය ...................................... වේ.
05. නර්තන චලන නිර්මාණයේදී අංග, ...................................... උපාංග කෙරෙහි අවධානය යොමු කළ යුතුය.
06. පද කටින් කියා නර්තනය කිරීම ...................................... වල ලක්ෂණයකි.
07. අලංකාර මාත්‍රා නිර්මාණයේදී ...................................... මනාව භාවිත කළ යුතුයි.
08. ආතුරයාගේ හිසේ සිට පාදාන්තය දක්වා වූ දෝෂ දුරු කිරීම සඳහා ...................................... කවි ගායනා කරයි.
09. මුල් කාලයේදී වන්නම් ...................................... සඳහා නිර්මාණය වූ බව කියැවේ.
10. පද කොටසක් අවසානයේදී නටන විශේෂ පද කොටස ...................................... නම් වේ.

(ල. 2 x 10 = 20)

■ පහත සඳහන් වාක්‍ය හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

01 වන්නම් නර්තනයේදී තාලානුරූප චලන යොද ගනියි. ( )
02. උඩරට සම්ප්‍රදායේදී ගොඩ සරඹ පද සබරගමු සම්ප්‍රදායේදී ඉලංගම් සරඹ ලෙස හඳුන්වයි. ( )
03. නර්තනයේදී භාවිත කරනු ලබන තාල වාද්‍ය භාණ්ඩය ලෙස ගැට බෙරය සැලකේ. ( )
04. මැණ්ඩියට සිටීමේදී දෙපා අතර පරතරය මිටි රියනකි. ( )
05. වන්නම් යනුවෙන් අදහස් කරන්නේ වර්ණ ගැන්වීම යන්නයි ( )

(ල. 2 x 5 = 10)

■ **පහත සඳහන් ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

1. ආධුනික නර්තන ශිල්පියෙකු ගොඩ සරඹ නැටීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

2. තුන්වන සහ පස්වන ගොඩ සරඹයන් හඳුන්වන සරඹ නාමයන් ලියන්න

3. උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය සහ ප්‍රධාන ශාන්තිකර්මය ලියන්න.

4. නර්තනයේදී භාවිත අවකාශයේ ප්‍රධාන කොටස් දෙක ලියන්න.

5. තාලම්පට වාදනයේදී භාවිත කරන ක්‍රම දෙක කුමක්ද?

6. වෛරොඩි වන්නමට අයත් තාල රූපය සහ බෙර පදය ලියන්න

7. තුරඟා වන්නමට අයත් තස්තිරම ලියන්න

8. ඔබ කැමති ගැමි නැටුම් දෙකක් නම් කර ඒ සඳහා භාවිත කරන රංග උපකරණ දෙකක් ලියන්න.

9. ඔබ දන්නා පතුරු හෝ සවරං කවියක් ලියන්න.

10. තුරඟා වන්නමේ බෙර පදය ප්‍රස්තාර කරන්න. (ල. 2 x 10 = 20)